**කයිට්ස් ප්‍රාදේශීය සභාව - 2021**

**---------------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

කයිට්ස් ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.1 ඡේදයේ (අ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | |
|---|---|---|---|
| (අ) | උතුරු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු. 519,874 ක් වටිනා යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | උතුරු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පරිත්‍යාග වශයෙන් ලැබුණු අවස්තාවේ නිකුත් කිරීමේ නියෝගවල භාණ්ඩවල වටිනාකම සඳහන් කර නොතිබුණි. | වත්කම් වල වටිනාකම ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | දේශය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 977,811 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දැක්විය යුතු වුවත් ණය ප්‍රාග්ධන යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ අවුරුදු 10 ක දීර්ඝ කාලීන ණයක් වශයෙන් ලබා ගත් ණය මුදලවන අතර, අදාල ගොඩනැගිල්ල අවසන් ගිණුම්වල ඉඩම් සහ ගොඩනැගිලි යටතේ ස්ථාවර වත්කම් වශයෙන් ගිණුම් ගතකර ඇත. එහෙයින් දීර්ඝ කාලීන වගකීමක් වශයෙන් ණය ප්‍රාග්ධනය ලෙස ගිණුම් ගත කර ඇත. | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර සටහන් කළ බව සනාථ කළ යුතු අතර අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ සභා ගබඩාගේ රු. 42,877 ක් වටිනා විදුලි උපකරණ අවසන් තොගය ලෙස තිබුණද, එම වටිනාකම ගබඩා තොග ලෙස ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම | 2021 වර්ෂයේ තොග වශයෙන් දැක්වුනු විදුලි උපකරණ 2021 අවසන් ගිණුම්වල දක්වා නොතිබුණි. ඉදිරියේදි විදුලි උපකරණ මූල්‍ය ප්‍රකාශනවලට | ගිණුම් කරණ ප්‍රතිපත්ති අනුව අදාල කටයුතු නිමකර ඇති බව සනාථ කර සටහන් කළ බව සනාථ කළ යුතු අතර |

| | | |
|---|---|---|
| වත්කම් සහ ආදායම් අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | එතුලත් කිරීමට කටයුතු කරමි. | අදාල අඩුපාඩු නිවැරදි කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-----------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,073,029 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,236,599 ක් විය.

**2.2** **ආදායම් රැස්කිරීම**

------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

| **විගණන නිරීකෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) **වරිපනම්** | | |
| 1987 හි අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) සහා බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලිවලින් අයකළ යුතු වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1987 හි අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(i) අනුව දේපළ තක්සේරු කිරීමේ කටයුතුවල අවසන් අධියර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් දැනට ඉටුකර ගෙන යන බැවින් එය නිමවූ පසු අප බලප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකිරීමට කටයුතු කරනු ලැබේ. | අදායම් රැස්කිරීමේ කළමනාකරණය ඵලදායීව සිදුකර හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කඩිනම් කළ යුතුය. |
| (ආ) **කුලි** | | |
| සභාව විසින් දීර්ඝ කාලීන වශයෙන් බදු දීමට හැකි කඩ කාමර 11 ක් බදු දී නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ රු. 139,200 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි. | පුවත්පත් සහ ප්‍රාදේශීය දැන්වීම් මගින් ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු කර ඇත. කෙසේවූවද, මෙම කඩකාමර බදු දීමට නොහැකි විය. 2022 වරෂයේදී බදු දී ඇති බව සඳහන් කරමි. | අදාල හිඟ මුදල් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් වාර්ෂිකව ටෙන්ඩර් කැඳවා බදු දෙන පොල කඩකාමර 05 ක් වර්ෂ 02 ක සිට ටෙන්ඩර් කැඳවා බදු දී නොතිබීමෙන් රු. 870,100 ක ආදායමක් අහිමිවී තිබුණි. | සභාව විසින් මෙම කඩ කාමර බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබූ අතර ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැත. | සභාවේ වත්කම් යොදවා ආදායම් ඉපියීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල තැන්පත් කර තිබූ රු. 26,891,013 ක මුදල යොදවා සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර පොලී ආදායම් ඉපයීම අරමුණෙන් බැංකුවේ තැන්පත් කර ඇත. | රු. 4,700,000 ක් වටිනාකමට සංවර්ධන වැඩ කරමින් පවතින අතර සුසානභූමි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. 408,038 ක් සහ 2019 වර්ෂයේ සංවර්ධන ප්‍රතිපාදන මගින් කන්නහෙයි අම්මන් තොටුපොල ගිමන්හලට දැල් ගැසීම සඳහා වෙන්කර ඇත. | අරමුදල් අරපිරිමැස්මෙන් හා උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සනාථ කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **භාර නොගත් වත්කම්** | | |
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වාහන 14 ක්, ඉඩම් 10 ක් සහ සභා බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි 09 ක් සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ රු. 10,322,600 ක් වටිනා මෝටර් වාහන 10 ක් සභාවේ නමට මාරුකර නොතිබුණි. දැනට ඉඩම් 04 ක තක්සේරු වටනාකම ලැබී ඇත. ඉදිරියේදි ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. ඉතිරිය සම්බන්ධයෙන් කටයුතු සිදුකර ඇත. | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් සභාවේ නමට පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක ඇප** | | |
| 2017 මාර්තු 07 දින PF/01/2017 (අ) අංක දරණ පළාත් මුල්‍ය චක්‍රලේඛයට අනුකූලව සභාව විසින් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ආදායම් අධීක්ෂණ නිලධාරි 02 ගෙන් සේවක ඇප වශයෙන් රු. 30,000 ක් ලබා ගෙන නොතිබුණි. | සේවය හැර ගිය නිලධාරීන් 2 ගෙන් අයවියයුතු මුදල අයකරීමට පළාත් මුදල් චක්‍රලේඛ NP/09/A&P/04/12/CIR/2020 අනුව අය කිරීමට කටයුතු කර ඇත. ඉතිරි නිලධාරීන් දෙදෙනා විශ්‍රාම ගන්වා ඇති බැවින් ඔබුන්ගෙන් අයවිය යුතු මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත PD3 ආකෘතිය යවා ඇත. | ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |